# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1635/15 – 2010 ජනවාරි 05 වැනි අඟහරුවාදා – 2010.01.05

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

# III කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### සංශෝධනයයි

### ඉඩම් අත්පත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

යොමු අංකය:කු/ප්‍රාලේ/16/04/22

අංක 1617/25 හා 2009-09-01 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයෙහි අංක 09-580 දරණ නිවේදනය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ආණ්ඩුව අත්පත් කරගෙන ඇති බැව්, ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ, මෙයින් දැනුම් දී සිටිමි.

අත්පත් කරගෙන ඇති ඉඩමේ විස්තර:

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ උඩගම්පහ කෝරළේ සුළු කොට්ඨාශයේ ගුණ්නෑපාන ගබඩාගම ගමේ පිහිටි මහනුවර දිස්ත්‍රික් මැනුම් අධිකාරී විසින් 2002.08.29 දින මැන පිළියෙල කරන ලද මූලික පිඹුරු අංක මහ.5344 හි සඳහන් ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් 0.0078ක් පමණ වූ ඉඩම් කැබැල්ල:

1. කැබලි අංක 40

ඉඩමේ නම: පල්ලිවෙලවත්ත; විස්තරය: ගෙවත්ත සහ ගොඩනැගිල්ලක කොටසක් ඇත; හිමිකම් කියන අය: රජය (මුල් හිමිකම්පාන්නා: එම්.ඉක්බාල්, පොල්ගොල්ලවත්ත, පොල්ගොල්ල.); ප්‍රමාණය: හෙක්. 0.0073.

2. කැබලි අංක 44

ඉඩමේ නම: ගල්වලේවත්ත; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය (මුල් හිමිකම්පාන්නා: එම්.ඉක්බාල්, පොල්ගොල්ලවත්ත, පොල්ගොල්ල.); ප්‍රමාණය: හෙක්. 0.0005.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලය ලත් අයවලුන් හෝ 2010 පෙබරවාරි මස 24 වැනි දින පෙ.ව. 10.00 ට කුණ්ඩසාලේ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ දී මා හමු විය යුතුයි.

තවද, 2010 පෙබරවාරි මස 15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් පිඹුරු අංකය හා කැබලි අංකය සඳහන් කරමින් ඔවුන්ගේ අයිතිවාසිකම් වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳව විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

එල්. ඒ. සුජාතා විජේසිංහ,<br>
ප්‍රාදේශිය ලේකම්,<br>
කුණ්ඩසාලේ.

2009 අගෝස්තු මස 04 වැනි දින,<br>
ප්‍රාදේශිය ලේකම් කාර්යාලය,<br>
කුණ්ඩසාලේ.

01 – 555

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී